**අයගම ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 නොසැසඳූ පාලන ගිණුම්

**----------------------------**

ගිණුම් විෂයයන් 05 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 10,275,834 ක වෙනසක් විය.

#### 1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

**---------------------------------------------------**

සභාව සතු ඉඩම් හා සුසාන භූමි 6 කට අදාලව ඔප්පු නොතිබුණු අතර, එක් ඉඩමකට අදාල ඔප්පුව හා පිඹුර නොතිබුණි.

### 1.3.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

----------------------------------------------------------------

එකතුව රු. 298,414 ක් වූ හිඟහිටි කුලී ආදායම් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 1,030,491 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 1,588,026 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 557,535 ක අඩුවීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 557,535 කින් අඩුවීම කෙරෙහි විෂයයන් 02 ක ආදායම් රු. 4,138,153 කින් අඩුවීම හා විෂයයන් 02 ක වියදම් රු. 137,680 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

------------------------

## 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000' | 000' | 000' |
| වරිපනම් හා බදු | 520 | 615 | 216 |
| බදු කුලී | 3,552 | 3,459 | 11 |
| බලපත්‍ර ගාස්තු | 253 | 480 | 17 |
| වෙනත් ආදායම් | 21,085 | 18,450 | 7,235 |

## 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 44, සියයට 31 හා සියයට 118 කින් වැඩි වී තිබූ අතර වරෙන්තු හා දඩ හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 30 හා සියයට 70 කින් අඩුවී තිබුණි.

## 2.3.3 බදුකුලී

2016 දෙසැම්බර් 31 දිනට කඩකාමර 11 කින් අයවිය යුතු එකතුව රු. 794,521 ක් වූ බදුකුලී 2017 අගෝස්තු වනවිටත් අයවී නොතිබුණි.

## 2.3.4 වෙනත් ආදායම්

------------------

සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ජල යෝජනා ක්‍රම 11 කට අදාලව 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතුව රු. 19,840 ක් වූ හිඟ ජල ගාස්තු 2017 අගෝස්තු වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 කාර්යසාධනය

-----------------

සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන, පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් නඟාසිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන, විමධ්‍යගත අරමුදල් සහ පළාත් සභා අරමුදල් යටතේ ඇස්තමේන්තු වටිනාකම රු. 16,149,897 ක් වූ කර්මාන්ත 49 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් එකතුව රු. 6,331,835 ක් වැයකර කර්මාන්ත 20 ක් පමණක් ඉටුකර තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ඉඩම් හා සුසාන භූමි සඳහා වැටවල් සකස් කිරීම 2017 අගෝස්තු වනවිටත් සිදුකර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය සේවා වැඩසටහන යටතේ 2016 වර්ෂය සඳහා වැසිකිලි ආධාර ලබාදීම වෙනුවෙන් රු. 75,000 ක් වෙන්කර, ප්‍රතිලාභීන් 14 දෙනෙකු තෝරාගෙන තිබුණද, එකඳු ප්‍රතිලාභියෙකු වෙත හෝ ආධාර ලබාදී නොතිබුණි.

(ඇ) සෞඛ්‍ය සේවා වැඩසටහන යටතේ මාතෘ හා ළමා සායන සඳහා 2016 වර්ෂයට අදාලව රු. 50,000 ක් වෙන්කර තිබුණද, එක් මාතෘ හා ළමා සායනයක් වෙනුවෙන් රු. 9,600 ක් පමණක් වැය කර තිබුණි.

(ඈ) දීර්ඝ කාලයක සිට පැවත එන ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක වටිනාකම රු. 1,079,017 ක් වූ අතර, අදාල ගිණුම් වලට ගැලපීම හෝ අදාල පාර්ශවයන්ට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුරනැඟුම වැඩසටහන යටතේ රු. 9,821,210 ක් වැයකර කඩකාමර 56 ක් සහිත අයගම සතිපොල ඉදිකිරීම 2015 වර්ෂයේ නිම කර තිබුණද, 2017 ජනවාරි වනවිටත් ගොඩනැගිලි වලින් ආදායම් ඉපයීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) වර්ෂ 02 සිට වර්ෂ 04 දක්වා වූ කාලයක් භාවිතයෙන් තොරව තිබූ සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 04 ක් 2017 අගෝස්තු වනවිටත් අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකර ක්‍රියාකාරී මට්ටමට පත්කිරීම හෝ අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබූ අතර, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු මෝටර් ග්‍රේඩරයක් භාවිතා කිරීමේ අපහසුතාවය මත වර්ෂ 02 ක් තිස්සේ නිෂ්කාර්යයව පැවතුණි.

## 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභාව විසින් කසළ බැහැර කිරීමේදී දිරන කසළ අයගම නගරයේ ක්‍රීඩාපිටියට යාබදව වලවල් කපා වසා දැමීමත්, නොදිරන කසළ කවරවලට අසුරා සභා භූමියේ තැබීමත් සිදු කරන අතර, කසළ බැහැර කිරීමට හෝ විනාශ කිරීමට නියමිත ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අපොහොසත් වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

## 4.1 අයවැය පාලනය

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 41 කට අදාලව එකතුව රු. 1,239,100 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 10 කට අදාලව එකතුව රු. 1,757,644 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 85 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | <u>පද්ධතිය</u> | | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර නොසැසඳීම් පැවතීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | නියමිත ආදායම අයකර නොගැනීම |
| | | (ii) | නියමිත ආදායම හඳුනා නොගැනීම |
| (ඇ) | වත්කම් පාලනය | | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඈ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |